සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - I කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

උපදෙස් :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල ( × ) ලකුණ යොදන්න.

01. අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ස්වරූප වුවමනා ලෙස හැඳින්විය හැක. වුවමනා පමණක් ඇතුලත් වන පිළිතුර තෝරන්න.
(1) අධ්‍යාපනය, ගුරුසේවය, රජයේ පාසල්, පුස්තකාල
(2) සාරි, කලිසම්, ගවුම්, ඇඳුම්
(3) රජයේ පාසල්, විභාග, ගුරුසේවය, පුස්තකාල
(4) ආහාර, ඇඳුම්, අධ්‍යාපනය, නිවාස

02. පාරිභෝගිකයාට මෙන්ම ව්‍යාපාර වලට සම්බන්ධ විවිධ පාර්ශවයන්ට ද ඔහුනොවුන්ට සුවිශේෂී අරමුණු පවතියි. ව්‍යාපාර අරමුණු ලෙස හැඳින්විය හැක්කේ කුමක් ද?
(1) ලාභ ඉපයීම සහ පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම.
(2) භාණ්ඩ හා සේවා වල ගුණත්වය ඉහළ නැංවීම.
(3) රැකියා උත්පාදනය හා සේවක සුභසාධනය.
(4) ලාභ ඉපයීම හා භාණ්ඩ හා සේවාවල ගුණත්වය ඉහළ නැංවීම.

03. ''ව්‍යවසායකත්වය'' යන්න වඩාත් හොඳින් අර්ථවත් වන්නේ,
(1) නව්‍යතා සම්පාදනය කරන්නා.
(2) ව්‍යාපාර අවදානම් දරන්නා.
(3) ව්‍යාපාර කටයුතු පිළිබඳව තීරණ ගන්නා.
(4) නිෂ්පාදන සාධක සංවිධානය කරමින් නිෂ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කර පවත්වාගෙන යන්නා.

04. ව්‍යාපාර කටයුතු පිළිබඳව උනන්දුවක් දක්වන විවිධ පාර්ශව ඇල්මැති පාර්ශව ලෙස හැඳින්වේ. රජය ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතු පමණක් ඇති පිළිතුර තෝරන්න.

A - පාරිභෝගිකයින් සුරක්ෂිත කිරීම.
B - ව්‍යාපාර සඳහා දිරිගැන්වීම් ලබා දීම.
C - බදු ආදායමක් ලබා ගැනීම.
D - ශ්‍රම ඵලදායීතාවය වැඩි කිරීම.

(1) ABD (2) ABC (3) BCD (4) ACD

05. පහත වගුවේ X තීරුවේ ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවද, Y තීරුවේ එසේ උනන්දු වීමට හේතුද දක්වා ඇත.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. අයිතිකරුවෝ | A - නියමිත වේලාවට අමුද්‍රව්‍ය සැපයීම |
| 2. කළමනාකරුවෝ | B - රැකියාවේ සුරක්ෂිත බව |
| 3. සේවකයෝ | C - ප්‍රමාණවත් ලාභයක් ලැබීමට |
| 4. සැපයුම්කරුවෝ | D - තීරණ වල සාර්ථකත්වය මැනීමට |

X තීරුවේ ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශව Y තීරුව සමග අනුපිළිවෙලින් ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ,
(1) CDAB (2) CDBA (3) BACD (4) BADC

06. ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව පමණක් දක්වෙන පිළිතුර වන්නේ,
(1) ප්‍රජාව, අනාගත ආයෝජකයෝ, රජය, පරිසරවේදීන්
(2) තරඟකරුවන්, ප්‍රජාව, ජනමාධ්‍යවේදීන්, පරිසරවේදීන්
(3) ප්‍රජාව, මූල්‍ය ආයතන, තරඟකරුවෝ, අනාගත ආයෝජකයෝ
(4) තරඟකරුවෝ, ජනමාධ්‍යවේදීන්, පරිසරවේදීන්, ප්‍රජාව

07. ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් පහත දැක්වෙන අවස්ථා සහ තර්ජන හඳුනාගත හැකි විය.

A - ගෝලීය ව්‍යාපාරයක් වෙළඳපොළට ප්‍රවේශ වීම.
B - රජයේ දැඩි බදු ප්‍රතිපත්තිය.
C - නව තාක්ෂණය රට තුළට ගලා ඒම.
D - නව මූල්‍ය නගරයක් බිහිවීම.

මින් බාහිර පරිසරයට අයත් අවස්ථා පමණක් අඩංගු පිළිතුර වන්නේ,
(1) C හා D (2) A හා B (3) B හා C (4) A හා D

08. ලංකා බැංකුව, මහජන බැංකුව ඇතුළු විවිධ වාණිජ බැංකු තම ගණුදෙනුකරුවන්ට උපරිම කාර්යක්ෂම සේවාවක් සැපයීමට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) රට පුරා ව්‍යාප්ත කරමින් පවතියි. මෙම ක්‍රියාවලිය අයත් වන පරිසර බලවේගය වන්නේ,
(1) නෛතික පරිසරය (2) ආර්ථික පරිසරය (3) ගෝලීය පරිසරය (4) තාක්ෂණික පරිසරය

09. ව්‍යාපාර පරිසරයේ, ව්‍යාපාරිකයෙකුට පහසුවෙන්ම පාලනය කළ හැකි පරිසරයකි,
(1) බාහිර පරිසරය (2) අභ්‍යන්තර පරිසරය
(3) ප්‍රජා පරිසරය (4) සමාජ සංස්කෘතික පරිසරය

10. බාහිර පරිසර සාධක පමණක් දැක්වෙන නිදසුන් A, B, C හා D වලින් තෝරන්න.

A - 2007 අංක 7 දරන සමාගම් පනත
B - ව්‍යාපාරික දැනුම හා පළපුරුද්ද
C - 1954 අංක 17 දරන සාප්පු හා කාර්යාල සේවක පනත
D - යහපත් ආකල්ප

(1) A, B හා C (2) B, C හා D (3) සියල්ලම. (4) A හා C පමණි.

11. ව්‍යාපාර පරිසරය සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) ජාත්‍යන්තර වෙළඳ සම්බාධක පැනවීම ව්‍යාපාරයක දුර්වලතාවයකි.
(2) සුවිශේෂී නිෂ්පාදන ක්‍රම ව්‍යාපාරයක අවස්ථාවකි.
(3) නව නගර බිහිවීම ව්‍යාපාරයක අවස්ථාවකි.
(4) අධිවේගී මාර්ග ඉදිකිරීම ව්‍යාපාරයක ශක්තියකි.

12. නිමල් හා සුනිල් එක්ව සුනිමල් නමින් රු. 10,000 ක ප්‍රාග්ධනයක් යොදා හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඔවුන්ගේ ව්‍යාපාරයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයකි,
(1) හවුල්කරුවන්ගේ වගකීම සීමිත වීම. (2) හවුල්කරුවන් අතර ගිවිසුමක් පැවතීම.
(3) නෛතික පුද්ගලභාවයක් පැවතීම. (4) ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් තිබීම.

13. පහත ව්‍යාපාර සංවිධාන අතුරින් පෞද්ගලික අංශයට පමණක් අයත් ව්‍යාපාර සහිත පිළිතුර නම්,

A - තනි පුද්ගල ව්‍යාපාර B - සංස්ථාපිත සමාගම්
C - සමූපකාර D - දෙපාර්තමේන්තු

(1) A හා B පමණි. (2) AB හා C ය. (3) B හා C ය. (4) A B C D සියල්ලමය.

14. ලිඛිත ගිවිසුමක් ලෙස හඳුන්වන්නේ,
(1) හවුල් ආඥාපනතයි. (2) හවුල් අයිතියයි. (3) හවුල් ඔප්පුවයි. (4) හවුල් බලපත්‍රයකි.

15. සිතුම් තාරුක සිය ව්‍යාපාර නාමය ''සිතු ටෙක්ස්'' ලෙස ලියාපදිංචි කර ඇත. එසේ ලියාපදිංචියේ ව්‍යාපාරයට ඇති වාසියකි,
(1) වගකීම සීමිත වීම. (2) නෛතික පුද්ගලභාවයක් ලැබීම.
(3) අඛණ්ඩ පැවැත්මක් ලැබීම. (4) අනන්‍යතාවයක් ලැබීම.

16. පහත සඳහන් ඒවායින් ගිණුම්කරණයේ දී ගණුදෙනුවක් ලෙස සැලකිය නොහැක්කේ,
(1) රු. 15000 ක මාසික වැටුපකට සේවකයකු බඳවා ගැනීම.
(2) රු. 15000 ක භාණ්ඩ තොගයක් ණයට විකිණීම.
(3) රු. 400 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
(4) ප්‍රචාරණ වියදම ලෙස රු. 50 000 ක් ගෙවීම.

17. ව්‍යාපාරයක වත්කම් හා වගකීම් සඳහා නිදසුන් සහිත පිළිතුර නම්,
(1) ගොඩනැගිලි, විකුණුම් (2) ඉඩම්, බැංකු ගිණුමේ ශේෂය
(3) බැංකු ණය, ණය හිමියෝ (4) ණයගැතියෝ, ණය හිමියෝ

18. ගිණුම්කරණ සමීකරණයේ ප්‍රධාන සංරචක නම්,
(1) වත්කම්, වගකීම් හා ආදායම් (2) වත්කම්, වගකීම් හා හිමිකම්
(3) වත්කම්, වගකීම් හා වියදම් (4) වත්කම්, ආදායම් හා වියදම්

19. ව්‍යාපාරයකට ආදායම් ලැබීම හේතුවෙන්,
(1) වත්කම් වැඩිවේ, හිමිකම් වැඩිවේ. (2) හිමිකම් අඩුවේ, වත්කම් වැඩිවේ.
(3) හිමිකම් අඩුවේ, වත්කම් අඩුවේ. (4) වත්කම් වැඩිවේ, වගකීම් වැඩිවේ.

20. ව්‍යාපාරයක ගණුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දැක්වේ.

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| -25 000 | = | -25 000 | | |

ඉහත සිද්ධියට අදාළ නිවැරදි ගණුදෙනුව විය හැක්කේ,
(1) රු. 25 000 ක භාණ්ඩ අත්පිට විකිණීම.
(2) රු. 25 000 ක භාණ්ඩ ණයට විකිණීම.
(3) රු. 25 000 ක් වටිනා භාණ්ඩ ව්‍යාපාරයට යෙදවීම.
(4) ව්‍යාපාරයේ විදුලි බිල රු. 25 000 ක් ගෙවීම.

21. ද්විත්ව සටහන් ක්‍රමයට අනුව එක් එක් ගිණුම්වල ගනුදෙනු සටහන් කරන ආකාරය පහත දැක්වේ. නිවැරැදි පිළිතුර තෝරන්න.

| ගිණුමේ නම | වැඩිවීම | අඩුවීම |
|---|---|---|
| (1) මෝටර් රථ ගිණුම | බැර | හර |
| (2) බැංකු ණය ගිණුම | හර | බැර |
| (3) සේවක වැටුප් ගිණුම | හර | බැර |
| (4) ණයගැති ගිණුම | බැර | හර |

22. ව්‍යාපාරයක අයිතිකරුගේ නිවසේ රු. 2000 ක දුරකථන බිල ව්‍යාපාරයේ මුදලින් ගෙවීම ගිණුම්ගත කිරීමට අදාල නිවැරැදි ද්විත්ව සටහන වනුයේ,

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (1) දුරකථන වියදම් | හර | 2000 | (2) ගැනිලි | හර | 2000 |
| මුදල් | බැර | 2000 | දුරකථන වියදම | බැර | 2000 |
| (3) ගැනිලි | හර | 2000 | (4) දුරකථන වියදම | හර | 2000 |
| මුදල් | බැර | 2000 | ගැනිලි | බැර | 2000 |

23. ''ලෙජරය'' සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) ගනුදෙනු සටහන් කරන පොදුවේ පිළිගත් ආකෘතියකි.
(2) ගනුදෙනුවක හර සහ බැර බලපෑම සටහන් කරන පොතකි.
(3) ගනුදෙනුවල ද්විත්ව සටහන තබන ගිණුමකි.
(4) වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම්, වියදම් ගිණුම් සියල්ලෙහි එකතුවකි.

24. රු. 4000 ක් වටිනා භාණ්ඩ තොගයක් ණයට මිලදී ගැනීම, පොත්වල සටහන් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

(1) මුදල් ගිණුම හර 4000
තොග ගිණුම බැර 4000

(2) ගැණුම් ගිණුම හර 4000
ණයහිමි ගිණුම බැර 4000

(3) ගැණුම් ගිණුම හර 4000
මුදල් ගිණුම බැර 4000

(4) තොග ගිණුම හර 4000
ණයහිමි ගිණුම බැර 4000

25. පහත X තීරුවේ මූලික සටහන් පොත් ද, Y තීරුවේ ගණුදෙනු දක්වේ. X තීරුවේ මූලික සටහන් පොත්වලට අදාල ගනුදෙනු පිළිවෙලට ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| X තීරුවේ | Y තීරුවේ |
|---|---|
| 1. මුදල් පොත | A - රු. 10000 ක ලීබඩු උපකරණ ණයට ගැනීම |
| 2. ගැණුම් ජ'නලය | B - ණයට විකුණුම් රු. 4000 |
| 3. විකුණුම් ජ'නලය | C - ණයට ගැණුම් රු. 5000 |
| 4. පොදු ජ'නලය | D - විදුලි බිල්පත් ගෙවීම රු. 2000 |

(1) ABCD (2) CBAD (3) BACD (4) DCBA

26. ජානක විසින් තම ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා 2018.09.01 දින රු. 150000 ක් වටිනා ලී බඩු උපකරණ සී/ස දඹුලු ෆර්නිචර් සමාගමෙන් ණයට මිලදී ගන්නා ලදී. 2018.09.30 දින ජනක චෙක්පතක් මඟින් ඉහත සම්පූර්ණ ණය මුදල ගෙවා පියවා දමන ලදී.
ඉහත ගනුදෙනුවලට අදාළ නිවැරදි මූලාශ්‍ර ලේඛන නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ගැණුම් ඉන්වොයිසිය, වවුචරය
(2) ජ'නල වවුචරය, පිළිපත
(3) ගැණුම් ඉන්වොයිසිය, පිළිපත
(4) පිළිපත, ජ'නල වවුචරය

27. මුදල් පොතේ බැංකු ශේෂය සංශෝධනය කිරීමේදී උපයෝගී කරගන්නා මූලාශ්‍ර ලේඛනය කුමක් ද?
(1) චෙක් පොතේ පිළිපත
(2) බැංකු සැසඳුම් ප්‍රකාශය
(3) බැංකු ප්‍රකාශනය
(4) චෙක් තැන්පතු පත

28. රනිල්ගේ ව්‍යාපාරයේ 2018.10.31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 20000 ක් වූ අතර බැංකු ප්‍රකාශයේ එම දිනට ශේෂය රු. 22000 ක් විය. මෙම වෙනසට හේතුව වනුයේ,
(1) තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක් රු. 2000.
(2) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 2000.
(3) බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකුව අය කළ ගාස්තු රු. 2000.
(4) ස්ථාවර නියෝග මත බැංකුව විසින් ගෙවූ රක්ෂණ ගාස්තු රු. 2000.

29. බැංකුවේ තැන්පත් කළ චෙක්පත් අගරු වීම, ගිණුම් තැබීමට අදාල නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

(1) බැංකු ගිණුම හර
ණයගැති ගිණුම බැර

(2) බැංකු ගිණුම හර
ණයහිමි ගිණුම බැර

(3) ණයගැති ගිණුම හර
බැංකු ගිණුම බැර

(4) ණයහිමි ගිණුම හර
බැංකු ගිණුම බැර

30. ව්‍යාපාරයක බැංකු ගිණුමේ ශේෂයට වඩා බැංකු ප්‍රකාශනයේ බැංකු ශේෂය වැඩිවීමට බලපාන හේතුවක් වන්නේ,
(1) බැංකු ගාස්තු
(2) ඍජු ප්‍රේෂණ
(3) අගරු වූ චෙක්පත්
(4) තන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්

31. තරුෂගේ ව්‍යාපාරය විසින් රු. 50 000 ක් වටිනා භාණ්ඩ නවීෂගේ ව්‍යාපාරයට ණයට විකුණන ලදී. දින 30 ක් ගතවීමට පෙර ණය පියවන්නේ නම් 10% ක වට්ටමක් ලබාදේ. වට්ටමට අදාළ ද්විත්ව සටහන වනුයේ,

(1) ණයගැති ගිණුම හර 5000
දුන් වට්ටම් ගිණුම බැර 5000

(2) ලද වට්ටම් ගිණුම හර 5000
ණයහිමි ගිණුම බැර 5000

(3) දුන් වට්ටම් ගිණුම හර 5000
ණයගැති ගිණුම බැර 5000

(4) ණයහිමි ගිණුම හර 5000
ලදවට්ටම් ගිණුම බැර 5000

- **ප්‍රශ්න අංක 31 හා 32 ට දිනුකගේ ව්‍යාපාරයේ පහත ගනුදෙනු උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.**
  - ★ 2018 ඔක්තෝබර් 01 දිනට සුළු මුදල් ශේෂය රු. 250.00
  - ★ 2018 ඔක්තෝබර් 30 දින දක්වා සුළු වියදම් රු. 8750.00
  - ★ 2018 ඔක්තෝබර් 31 දිනට සුළු මුදල් ශේෂය රු. 1250.00

32. දිනුකගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම කොපමණ ද?
(1) රු. 90000 (2) රු. 1000 (3) රු. 8750 (4) රු. 10000

33. දිනුකගේ ව්‍යාපාරයේ 2018 ඔක්තෝබර් 01 දිනට ප්‍රතිපූර්ණය කරන ලද අග්‍රිමයේ වටිනාකම වනුයේ,
(1) රු. 9000 (2) රු. 8750 (3) රු. 9750 (4) රු. 8000

34. සරසිගේ ව්‍යාපාරය රු. 100 000 ක් වටිනා භාණ්ඩ තොගයක් අහමඩ්ගේ ව්‍යාපාරයෙන් 10% ක වෙළඳ වට්ටමකට යටත්ව ණයට මිලදී ගැනීමට අදාල ද්විත්ව සටහන වනුයේ,

(1) ණයහිමි ගිණුම හර 90000
ගැනුම් ගිණුම බැර 90000

(2) ගැනුම් ගිණුම හර 90000
ණයහිමි ගිණුම බැර 90000

(3) ණයහිමි ගිණුම හර 100000
ගැනුම් ගිණුම බැර 100000

(4) ගැනුම් ගිණුම හර 100000
ණයහිමි ගිණුම බැර 100000

35. සංජයගේ ව්‍යාපාරය රු. 200 000 ක් වටිනා භාණ්ඩ අංජනගේ ව්‍යාපාරයෙන් ණයට මිලදී ගන්නා ලදී. අංජනගේ ව්‍යාපාරයේ එම ගනුදෙනුවට අදාල මූලාශ්‍ර ලේඛනය හා උපයෝගී පොත නම්,
(1) ගැනුම් ඉන්වොයිසිය, ගැනුම් ජ'නලය
(2) ලදුපත, මුදල් පොත
(3) විකුණුම් ඉන්වොයිසිය, විකුණුම් ජ'නලය
(4) ජ'නල් වවුචරය, පොදු ජ'නලය

36. පොදු ජ'නලයේ සටහන් කරන ගනුදෙනුවක් නොවන්නේ,
(1) ගැළපුම් සටහන් (2) ආරම්භක සටහන්
(3) වැරදි නිවැරදි කිරීමේ සටහන් (4) ලී බඩු අත්පිට මුදලට මිලදී ගැනීම

37. ලෙජර් ගිණුම් තුලනය කර ලබා ගන්නා ශේෂ ඇසුරින් පිළියෙල කරනු ලබන ලේඛනය වනුයේ,
(1) ලෙජරය (2) ශේෂ පිරික්සුම (3) ජ'නලය (4) මුදල් පොත

38. අමිලගේ ව්‍යාපාරයේ රු. 50 000 ක් ණයට විකුණුම්, ණයහිමි ගිණුමට හර කර, විකුණුම් ගිණුමට බැර කර ඇත. එම වරද නිවැරදි කිරීමට අදාල ද්විත්ව සටහන නම්,

(1) විකුණුම් ගිණුම හර 50000
ණයහිමි ගිණුම බැර 50000

(2) ණයගැති ගිණුම හර 50000
ණයහිමි ගිණුම බැර 50000

(3) ණයගැති ගිණුම හර 50000
විකුණුම් ගිණුම බැර 50000

(4) ගැනුම් ගිණුම හර 50000
ණයහිමි ගිණුම බැර 50000

- **සචින්ගේ ව්‍යාපාරයේ ගිණුම් පොත් තබන්නා විසින් ගිණුම් තැබීමේදී පහත වැරදි සිදු වී ඇත.**

A - රු. 8000 ක ලැබූ ගෙවල් කුලී මුදල් පොතට හර කිරීම හැර වෙනත් සටහනක් ලබා නොහැත.
B - රු. 5300 ක් රක්ෂණ ගාස්තු ගෙවීම රක්ෂණ ගාස්තු ගිණුමට හර කොට ඇත්තේ රු. 3500 ක් ලෙසය.
C - රු. 9100 ක් වූ විදුලි ගාස්තු ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට ගෙන නොමැත.

39. ශේෂ පිරික්සුම අසමාන වීමට බලපාන ගනුදෙනු වන්නේ,
(1) A ය. (2) B ය. (3) A හා B ය. (4) A, B හා C ය.

40. ඉහත සඳහන් වැරදි නිසා පැන නැගී තිබූ අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂය වනුයේ,
(1) රු. 700 බැර ශේෂයක් ය. (2) රු. 2900 ක හර ශේෂයක් ය.
(3) රු. 15300 ක බැර ශේෂයක් ය. (4) රු. 18900 ක හර ශේෂයක් ය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - II කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

<u>වැදගත් :</u>

- **පළමු ප්‍රශ්ණයටත් I කොටසින් ප්‍රශ්න දෙකක්ද,II කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

---

01. පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර ප්‍රශ්න අංක (1) සිට (10) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සුලෝචනා මහත්මිය, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කාන්තාවන් ස්වයං රැකියා සඳහා යොමු කිරීමේ අරමුණින් පවත්වනු ලැබූ පාවහන් නිෂ්පාදනය පිළිබඳ පාඨමාලාවක් හදාරා ඇත. ඇය තමන් සතු රුපියල් ලක්ෂ තුනක මුදල ද සමෘද්ධි බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් ලක්ෂ දෙකක මුදලක් ද ලබාගෙන ''සනීපා'' නමින් පාවහන් නිෂ්පාදන ව්‍යාපාරයක් 2018 ජූනි මස පළමුවන දින වාරියපොල නගර මධ්‍යයේ ආරම්භ කරන ලදී. ඇය ව්‍යාපාරය දියුණුවත්ම අත් උදව්වට සිටි සචිනි සමඟ එකතුවී ''සුලෝචනා ඇන්ඩ් සචිනි පාවහන්'' නමින් ව්‍යාපාරය ලියාපදිංචි කර පවත්වා ගෙන යාමට අදහස් කරන්නීය.

2018 ජූනි මාසය තුළ ''සනීපා'' ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු පහත වේ.

- 2018.06.02 රු. 50000 ක් යොදා ජංගම ගිණුමක් ආරම්භ කිරීම.
- 2018.06.05 රු. 100000 ක් වටිනා මහන යන්ත්‍රයක් කල්ප සමාගමෙන් ණයට ගැනීම.
- 2018.06.06 රු. 250000 ක් වටිනා පාවහන් ද්‍රව්‍ය මිලදී ගැනීම.
- 2018.06.06 රු. 25000 ක් වටිනා අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීම.
- 2018.06.25 රු. 15000 ක් සචිනිට වැටුප් ලෙස ගෙවීම.
- 2018.06.28 රු. 5000 ක් විදුලිගාස්තු ගෙවීම.
- 2018.06.28 රු. 1500 ක් වටිනා සපත්තු ජෝඩුවක් සුලෝචනා මහත්මිය තමන්ගේ ප්‍රයෝජනයට ලබා ගැනීම.

(1) (i) ''සනීපා'' නම් ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත්වේ ද? (ල.01)

(ii) එම ව්‍යාපාරයේ අවාසියක් සඳහන් කරන්න. (ල.01)

(2) (i) ''සුලෝචනා ඇන්ඩ් සචිනි පාවහන්'' නම් ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේද? (ල.01)

(ii) ''සනීපා'' ව්‍යාපාරයට සාපේක්ෂව ''සුලෝචනා ඇන්ඩ් සචිනි පාවහන්'' ව්‍යාපාරයේ දැකිය හැකි වාසියක් ලියන්න. (ල.01)

(3) (i) ''සනීපා'' ව්‍යාපාරය සතු අවස්ථාවක් සඳහන් කරන්න. (ල.01)

(ii) ''සුලෝචනා ඇන්ඩ් සචිනි පාවහන්'' ව්‍යාපාරය සතු ශක්තියක් ලියන්න. (ල.01)

(4) ''සුලෝචනා ඇන්ඩ් සචිනි පාවහන්'' ව්‍යාපාරය ලියාපදිංචි කිරීමෙන් අත්පත් කරගත හැකි වාසි දෙකක් ලියන්න. (ල.02)

(5) 2018 ජූනි 01 වන දිනට හිමිකම ගණනය කරන්න. (ල.02)

(6) 2018.06.05 වන දින ගනුදෙනුවට අදාල ද්විත්ව සටහන අගයන් සහිතව ලියන්න. (ල.02)

(7) (i) ජංගම වත්කමක් ද,

(ii) ජංගම නොවන වගකීමක් ද සඳහන් කරන්න. (ල.1×2=2)

(8) ව්‍යාපාරයේ මුදල් පොතේ ශේෂය 2018.06.30 දිනට කොපමණ ද? (ල.02)

(9) අයිතිකරුගේ හිමිකම අඩුවීමට බලපාන ගනුදෙනු දෙකක් ලියන්න. (ල.02)

(10) ව්‍යාපාරයේ ගනුදෙනුවලට අදාල මූලාශ්‍ර ලේඛන දෙකක් සඳහන් කරන්න. (ල.02)

(මුළු ලකුණු 20)

# I - කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) (අ) ව්‍යාපාර යන්න නිර්වචනය කරන්න.

(ආ) ව්‍යාපාර නිරත වන ප්‍රධාන කටයුතු 02 ක් නම් කරන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) රැකියා උත්පාදනය ව්‍යාපාර වල අරමුණු වලින් එකකි. (.......)

(ආ) සෑම ව්‍යාපාරයකම මූලික අරමුණ ලාභය පමණි. (.......)

(ඇ) අතීතයේ පැවති ව්‍යාපාර වලට වඩා වර්තමාන ව්‍යාපාර කටයුතු සංකීර්ණ නොමැත. (.......)

(ඈ) රාජ්‍ය අංශයේ සමහර ව්‍යාපාර ලාභ ඉපයීමට වඩා සේවා සැපයීම අරමුණු කරගෙන පවත්වාගෙන යයි. (.......)

(ල.02)

(iii) අවශ්‍යතා මත ඇති වන වුවමනා ඉටුකරගැනීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට ව්‍යාපාර වැදගත් වේ.

(අ) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතයේ ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කළ හැකි කොටස් දෙක නම් කරන්න.

(ආ) එම එක් එක් ව්‍යාපාර සඳහා නිදසුන බැගින් සපයන්න. (ල.02)

(iv) උසස් පෙළ වාණිජ ශිෂ්‍ය කණ්ඩායමක් තම කණ්ඩායම් ව්‍යාපෘතිය ලෙස ඉවත ලන කඩදාසි වලින් සුභ පැතුම් පත් නිර්මාණය කිරීමට අදහස් කරයි. ඒ සඳහා කණ්ඩායමේ සිසුන්ගේ ශ්‍රමය හා පංතිභාර ගුරුතුමාගේ දැනුම යොදා ගැනීමට අදහස් කරයි. එයට අවශ්‍ය දෑ ලෙස ඉවතලන කඩදාසි, ප්ලාස්ටික් බඳුන් කිහිපයක්, ජලය, වාතය හා මනා හිරු එළිය වැටෙන පාසලේ භූමි ප්‍රදේශයක් අවශ්‍ය විය. මෙම කණ්ඩායම ''පරිසර මිතුරෝ'' ලෙස නම් කල අතර මොවුන් එකතු වී මේ සඳහා යන්ත්‍රයක් ද මිලදී ගන්නා ලදී.

ඉහත සිද්ධියට අදාලව පහත දැක්වෙන නිෂ්පාදන සම්පත් සඳහා නිදසුන බැගින් ලියන්න.

| භූමිය | ශ්‍රමය | ප්‍රාග්ධනය | ව්‍යවසායකත්වය |
|---|---|---|---|
| (අ) ............................ | (ආ) ............................ | (ඇ) ............................ | (ඈ) ............................ |

(ල.02)

(මුළු ලකුණු 08)

03. (i) (අ) ව්‍යාපාර කෙරෙහි බලපාන බාහිර පරිසරය යනු කුමක් ද?

(ආ) බාහිර පරිසර සාධක දෙකක් ලියන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න. (ල.02)

(අ) අභ්‍යන්තර පරිසර සාධකයක් ලෙස නෛතික පරිසරය දැක්විය හැක. (......)

(ආ) දේශපාලන පරිසරයට බලපාන එක් සාධකයක් ලෙස රජයේ අයවැය ප්‍රතිපත්තිය නම් කළ හැක. (......)

(ඇ) ආදායම් ව්‍යාප්තිය ආර්ථික පරිසරයට අයත් සාධකයක් වේ. (......)

(ඈ) ජාත්‍යන්තර සබඳතා තාක්ෂණික පරිසරයට අයත් සාධකයක් වේ. (......)

(iii) පහත දැක්වෙන රටවල මුදල් ඒකක වර්ගය නම් කරන්න. (ල.02)

| රට | මුදල් ඒකකය |
|---|---|
| ඇමෙරිකා එක්සත් ජනපදය | (අ) ........................................................... |
| ඉන්දියාව | (ආ) ........................................................... |
| ජපානය | (ඇ) ........................................................... |
| යුරෝපා සංගමය | (ඈ) ........................................................... |

(iv) ගෝලීයකරණය යනු ලෝකයේ රටවල් අතර ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් ඇති අන්‍යෝන්‍ය බැඳීමයි.

(අ) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑම් දෙකක් ලියන්න.

(ආ) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑම් දෙකක් ලියන්න. (ල.02)

(මුළු ලකුණු 08)

04. (i) අරමුණ අනුව ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමේදී ප්‍රධාන වශයෙන් අරමුණු 02 ක් පදනම් කරගනියි.

(අ) එම අරමුණු දෙක නම් කරන්න.

(ආ) එම අරමුණු 02 සඳහා නිදසුන් බැගින් ලියන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) තනි පුද්ගල ව්‍යාපාරයක ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් ලබා දේ.

(ආ) දෙපාර්තමේන්තු මහා පරිමාණ සේවා සැපයීම සඳහා උචිත ව්‍යාපාර සංවිධානයකි.

(ඉ) ව්‍යාපාරයක කළමණාකරණ කටයුතු පුද්ගලයින් කිහිප දෙනෙකු මගින් කරගැනීමට අපේක්ෂා කරන්නේ නම් සංස්ථාපිත සමාගම් උචිත වේ.

(ඊ) හවුල් ගිවිසුමක් ඇතිවිය හැක්කේ ලිඛිතව පමණි. (ල.02)

(iii) තනි තීරණ ගැනීමට කැමති ධනුක ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි.

(අ) ධනුකට ආරම්භ කිරීමට උචිත ව්‍යාපාර සංවිධානය නම් කරන්න.

(ආ) එම ව්‍යාපාරයෙන් ඔහුට ලැබෙන වාසි දෙකක් ලියන්න. (ල.02)

(iv) වර්තමානයේ බොහෝ ව්‍යාපාර සංවිධාන ඒවායේ ගිණුම්කරණ කටයුතු පරිගණක ගත කර ඇත.

(අ) පරිගණකය ආශ්‍රිත ගිණුම්කරණයේ වාසි 02 ක් ලියන්න.

(ආ) වර්තමානයේ භාවිතා කරණ ගිණුම්කරණ මෘදුකාංග පැකේජ 02 ක් නම් කරන්න. (ල.02)

(මුළු ලකුණු 08)

# II - කොටස - ගිණුම්කරණය

05. (i) (අ) ගිණුම්කරණය යනු කුමක් ද? (ල.01)

(ආ) ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ කුමක් ද? (ල.01)

(ii) 2018 වර්ෂයේ අගෝස්තු මාසයේ දී කසුන් සංජීව ව්‍යාපාරයක් ආරම්භ කළේය. ඔහුගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් ගිණුම්කරණ සමීකරයට බලපාන ආකාරය පහත දැක්වේ. ඊට අදාළ එක් එක් ගනුදෙනුව ලියන්න.

| | වත්කම් | | | | | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මුදල් | + | ණයගැතියෝ | + | භාණ්ඩ තොගය | = | | | |
| (අ) | + 500 000 | | | | | = | + 500 000 | | |
| (ආ) | + 300 000 | | | | | = | | | + 300 000 |
| (ඉ) | - 50 000 | | | | + 50 000 | = | | | |
| (ඊ) | - 5 000 | | | | | = | - 5 000 | | |

(ල.½x4=2)

(iii) චෙනුරගේ ව්‍යාපාරයේ 2018 මැයි මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

5/1 චෙනුර විසින් රු. 50 000 ට භාණ්ඩ තොගයක් සුපුන්ට ණයට විකිණීම.

5/7 චෙනුර තම ව්‍යාපාරයේ දුරකථන බිල රු. 5 000 ක් ගෙවීම.

5/10 ව්‍යාපාරයට රු. 25 000 ක් වටිනා භාණ්ඩ තොගයක් පියල්ගෙන් ණයට ගැනීම

5/12 චෙනුරගේ නිවසේ විදුලි බිල වූ රු. 3 000 ව්‍යාපාරයේ මුදලින් ගෙවීම.

ඉහත ගනුදෙනුවලට අදාළ ලෙජර් ගිණුම් පිළියෙළ කරන්න. (ල.04)

(iv) සත්සරණිගේ ව්‍යාපාරයේ මැයි මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයක බලපෑම ගිණුම්කරණ සමීකරණය ඇසුරින් පහත පරිදි දක්වා ඇත. එම එක් එක් දිනයේ සිදු වූයේ යැයි අපේක්ෂිත ගනුදෙනුව වටිනාකම් සහිතව ලියන්න. (ල.04)

| දිනය | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| 5/1 | අඩුවේ | | | | |
| | වැඩිවේ | | | | |
| 5/4 | වැඩිවේ | = | වැඩිවේ | | |
| 5/7 | අඩුවේ | = | | | අඩුවේ |
| 5/10 | අඩුවේ | = | අඩුවේ | | |

(මුළු ලකුණු 12)

06. (i) මුදල් පොතේ ද්විත්ව කාර්යය නම් කරන්න. (ල.02)

(ii) මුදල් පොතේ වට්ටම් තීරු තුලනය නොකරයි. ඊට හේතුව පැහැදිලි කරන්න. (ල.02)

(iii) කවීෂගේ ව්‍යාපාරයේ 2018 ඔක්තෝබර් මාසය සඳහා පිළියෙල කළ සුළු මුදල් පොත පහත දැක්වේ.

සුළු මුදල් පොත

| ලැබීම් රු. | ස. පි. | දිනය | විස්තරය | ව. ආ. | ගෙවීම් රු. | විශ්ලේෂණ තීරු: ගමන් රු. | තැපැල් රු. | ලිපිද්‍රව්‍ය රු. | ලෙජර ගිණුම රු. | ලෙ. පි. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 200 | | 10/01 | ශේෂය | | | | | | | |
| .....?....... | | 10/01 | මුදල් | | | | | | | |
| | | 10/03 | මුද්දර ගාස්තු | 1 | 60 | | 60 | | | |
| | | 10/05 | ත්‍රීරෝද රථ ගාස්තු | 2 | 120 | 120 | | | | |
| | | 10/08 | ඡායා පිටපත් කොළ | 3 | 300 | | | 300 | | |
| | | 10/10 | නිමල්ට ගෙවීම් | 4 | 400 | | | | 400 | |
| | | 10/12 | ගමන් වියදම් | 5 | 100 | 100 | | | | |
| | | 10/15 | ලිපි ගොනු කවර | 6 | 50 | | | 50 | | |
| | | 10/20 | ලියාපදිංචි ගාස්තු | 7 | 150 | | 150 | | | |
| | | 10/25 | කුලී රථ ගාස්තු | 8 | 200 | 200 | | | | |
| | | | | | 1380 | ....?..... | ....?...... | ....?...... | .....?..... | |
| | | 10/31 | ශේෂය ප/ගෙ | | 120 | | | | | |
| 1500 | | | | | 1500 | | | | | |
| 120 | | 11/01 | ශේෂය ඉ/ගෙ | | | | | | | |

අවශ්‍ය වන්නේ,

(අ) මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම.

(ආ) 2018.10.01 දින ප්‍රතිපූර්ණය කළ මුදල.

(ඉ) ඉහත සුළු මුදල් ගෙවීම්වලට අදාල තොරතුරු ලෙජර් ගිණුම්වලට පිටපත් කිරීම. (ල.04)

(iv) සිරිසේනගේ ව්‍යාපාරයේ 2018.10.01 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ බැර ශේෂය රු. 25000 කි. 2018 ඔක්තෝබර් මාසය තුළදී පහත බැංකු ගනුදෙනු සිදුවිය.

10/02 රු. 50 000 ක් බැංකුවේ තැන්පත් කිරීම.

10/04 ණයහිමියකු සඳහා චෙක්පතක් නිකුත් කළා රු. 4500 යි. ලද වට්ටම රු. 500 යි.

10/05 ණයගැතියකුගෙන් ලද චෙක්පතක් බැංකුගත කළා රු. 5000 යි.

10/10 කඩකුලී මුදලින් ගෙව්වා රු. 2500 යි.

10/15 10/05 දින බැංකුවේ තැන්පත් කළ චෙක්පත අගරු වීම.

10/20 විදුලි වියදම් පියවීම සඳහා චෙක්පත් නිකුත් කළා රු. 1500 යි.

අවශ්‍ය වන්නේ,

ඉහත ගනුදෙනු ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් කර 2018.10.31 දිනට බැංකු ශේෂය ගණනය කිරීම. (ල.04)

(මුළු ලකුණු 12)

07. (i) බැංකු අයිරාවක් යනු කුමක් ද? (ල.02)

(ii) බැංකු ප්‍රකාශනයක හර තීරුවේ සටහන්වන ගනුදෙනු හා බැර තීරුවේ සටහන් වන ගනුදෙනු දෙක බැගින් සඳහන් කරන්න. (ල.02)

(iii) ජානකගේ ව්‍යාපාරයේ 2018.10.31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 16000 ක් විය. නමුත් 2018 ඔක්තෝබර් මාසය සඳහ බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශයේ ශේෂය, බැංකු ගිණුමේ ශේෂය හා නොගැලපුනි. පසුව වෙනසට හේතු ලෙස පහත කරුණු අනාවරණය කරගන්නා ලදී.

- ★ බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකුව කළ ස්ථාවර නියෝග මත ගෙවීම රු. 5000 කි.
- ★ තැන්පත් කළ නමුත් නිශ්කාෂනය නොවූ චෙක්පත් රු. 2000 කි.
- ★ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම රු. 3600 කි.

අවශ්‍ය වන්නේ,

(අ) 2018.10.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

(ආ) 2018.10.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම. (ල. 04)

(iv) සඳුනිගේ ව්‍යාපාරයේ 2018.10.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම තුලනය නොවීය. එහි වෙනස වූ රු. 1600 ක හර ශේෂය අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. පසුව පහත සඳහන් වැරදි අනාවරණය විය.

A - රු. 4500 ක ගැනුම් ඉන්වොයිසියක් පිළිබඳ ගිණුම් පොත්වල කිසිදු සටහනක් නොමැත.

B - ගෙවූ වේතන රු. 5400 වේතන ගිණුමේ රු. 4500 ක් ලෙස සටහන් කර ඇත.

C - මෝටර් රථ අලුත්වැඩියා වියදම් වූ රු. 1500 මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.

D - ලද පොලී ආදායම් රු. 800 මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.

අවශ්‍ය වන්නේ,

(අ) වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල සටහන් ලියන්න.

(ආ) අවිනිශ්චිත ගිණුම පිළියෙල කරන්න. (ල. 04)

(මුළු ලකුණු 12)

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(4) | 4 -(2) | 5 -(2) | 6 -(3) | 7 -(1) | 8 -(4) | 9 -(2) | 10 -(4) |
| 11-(3) | 12 -(2) | 13 -(2) | 14 -(3) | 15 -(4) | 16 -(1) | 17 -(4) | 18 -(2) | 19 -(1) | 20 -(4) |
| 21-(3) | 22 -(3) | 23 -(4) | 24 -(2) | 25 -(4) | 26 -(2) | 27 -(3) | 28 -(2) | 29 -(2) | 30 -(2) |
| 31-(3) | 32 -(4) | 33 -(2) | 34 -(2) | 35 -(3) | 36 -(4) | 37 -(2) | 38 -(2) | 39 -(4) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

**II පත්‍රය - I කොටස**

01. (1) (i) ඒක පුද්ගල ව්‍යාපාර (පෞද්ගලික අංශයේ / ලාභ අරමුණු කරගත්) (ල.01)

(ii) අයිතිකරුගේ වගකීම අසීමිත වීම / ප්‍රාග්ධනය රැස්කරගැනීමේ දුෂ්කරතා පැවතීම / අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම / ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම / අයිතිකරු තනි ව ගන්නා තීරණ ඇතැම්විට අසාර්ථක විය හැකි වීම. (ල.01)

(2) (i) පෞද්ගලික අංශයේ / ලාභ අරමුණු කරගත් / හවුල් ව්‍යාපාරයක් (ල.01)

(ii) වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකිවීම / හවුල්කරුවන් සතු විශේෂ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකි වීම / වගකීම හවුල්කරුවන් අතර බෙදීයාම / සාමූහික තීරණගත හැකිවීම (ල.01)

(3) (i) අවස්ථාව - වාරියපොල නගර මධ්‍යයේ ආරම්භ කිරීම (ල.01)

(ii) අත් උදව්වට සිටි සචිනි සතු පාවහන් නිෂ්පාදනය කිරීමේ පළපුරුද්ද (ල.01)

(4) හවුල් ව්‍යාපාරය ලියාපදිංචි කිරීමෙන් අත්පත් කරගත හැකි වාසි :- අනන්‍යතාවක් ලැබීම / ව්‍යාපාරයේ නාමයේ අයිතිය තහවුරු වීම / රජයෙන් ලබා දෙන දිරිගැන්වීම් ලබා ගැනීමට සුදුසුකමක් වීම / ණය ලබාගැනීමේ පහසුවක් වීම (ල.02)

(5) 2018.06.01 දිනට හිමිකම

| | | | | |
|---|---|---|---|---|
| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
| මුදල් 300000 | = | 300000 | + | |
| මුදල් 200000 | | | + | 200000 |
| හිමිකම | = | රු. 300 000.00 | | (ල.02) |

(6) මහන යන්ත්‍ර ගිණුම හර 100 0000
කල්ප සමාගම බැර 100 000 (ල.02)

(7) (i) මුදල්, භාණ්ඩ තොගය

(ii) සමෘද්ධි බැංකුවෙන් ලබාගත් රු. 2000000 ක බැංකු ණය. (ල.02)

(8) • මුදල් ගිණුමක් පිළියෙළ නොකර නිවැරදි මුදල් ශේෂය ගණනය කර ඇත්නම් ලකුණු දෙන්න. (ල.02)

**මුදල් පොත**

| දිනය | ලදුපත් අංකය | විස්තරය | ලෙ පි | වටිනාකම | දිනය | ගෙවීම් වවුචරය | විස්තරය | ලෙ පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| 06/1 | | ප්‍රාග්ධන ගිණුම | | 300 000 | 06/2 | | බැංකු ගිණුම | | 50 000 |
| 06/ | | බැංකු ණය | | 200 000 | 06/5 | | පාවහන් ද්‍රව්‍ය | | 250 000 |
| | | | | | 06/6 | | අනෙකුත් ද්‍රව්‍ය | | 25 000 |
| | | | | | 06/25 | | වැටුප් | | 15 000 |
| | | | | | 06/28 | | විදුලි ගාස්තු | | 5 000 |
| | | | | | 06/30 | | ශේෂය ප /ගෙ | | 155 000 |
| | | | | 500 000 | | | | | 500 000 |
| | | ශේෂය ඉ/ගෙ | | 155 000 | | | | | |

(9) ● භාණ්ඩ ගැනිලි (රු. 1500 ක් වටිනා සපත්තු ජෝඩුවක් පෞද්ගලික ප්‍රයෝජනය ගැනීම) ● වියදම් දැරීම (සේවක වැටුප්, විදුලි ගාස්තු) (ල.02)

(10) ජ'නල් වවුචර, ලදුපත, ගෙවීම් වවුචරය (ල.02)

## I - කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) (අ) මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය වූ විවිධ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත කටයුත්තකි.

(ආ) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය / බෙදාහැරීම (ල.02)

(ii) (අ) සත්‍යය (ආ) අසත්‍යය (ඇ) අසත්‍යය (ඈ) සත්‍යය (ල.02)

(iii) (අ) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර / සේවා නිෂ්පාදන ව්‍යාපාර

(ආ) ● භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර - ටයර් නිෂ්පාදනය, පාන් නිෂ්පාදනය, ඇඳුම් නිෂ්පාදනය

● සේවා නිෂ්පාදන ව්‍යාපාර - බැංකු, රෝහල්, සිල්ලර වෙළඳසැල් (ල. 02)

(iv) ● භූමිය - පාසල් භූමිය, හිරු එළිය, ජලය, වාතය ● ශ්‍රමය - නිපුනගේ දැනම, කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන්ගේ ශ්‍රමය ● ප්‍රාග්ධනය - කඩදාසි, ප්ලාස්ටික් බෑග්, යන්ත්‍රය, මුදල් ● ව්‍යවසායකත්වය - පරිසර මිතුරෝ / වාණිජ ශිෂ්‍ය කණ්ඩායම (ල.02)

03. (i) (අ) ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වයට බලපාන ව්‍යාපාරයෙන් පරිබාහිරව ක්‍රියාත්මක වන පාර්ශව සහ බලවේග බාහිර පරිසරය ලෙස හැඳින්විය හැක.

(ආ) ගණුදෙනුකරුවන් / සැපයුම්කරුවන් / තරඟකරුවෝ / දේශපාලන පරිසරය / තාක්ෂණික පරිසරය (ල.02)

(ii) (අ) අසත්‍යය (ආ) සත්‍යය (ඇ) සත්‍යය (ඈ) අසත්‍යය (ල.02)

(iii) (අ) ඇමරිකානු ඩොලර් (ආ) ඉන්දියානු රුපියල් (ඇ) ජපන් යෙන් (ඈ) යූරෝ (ල.02)

(iv) (අ) නවීන තාක්ෂණය ලබාගත හැකි වීම / ගුණාත්මක විදේශ අමුද්‍රව්‍ය ලබාගත හැකි වීම / කාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර ලබාගත හැකි වීම / විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම

(ආ) දැඩි තරඟකාරීත්වයට මුහුණ දීමට සිදු වීම / දේශීය පුහුණු ශ්‍රමය විදේශ රට වලට ඇදී යාම / දේශීය ව්‍යාපාරවල පැවැත්ම අස්ථාවර වීම / සංස්කෘතික බලපෑම් (ල.02)

04. (i) (අ) ලාභ ලැබීමේ අරමුණු / සාමාජික සුභ සාධන අරමුණු

(ආ) තනි පුද්ගල ව්‍යාපාර / ග්‍රාමීය සුභසාධන සංගමය / බෞද්ධ සංගමය / මරණාධාර සමිතිය (ල. 02)

(ii) (අ) අසත්‍යයයි (ආ) සත්‍යයයි (ඉ) සත්‍යයයි (ඊ) අසත්‍යයයි (ල. 02)

(iii) (අ) තනි පුද්ගල / කේවල ස්වාමි / ඒක පුද්ගල ව්‍යාපාරයකි

(ආ) පහසුවෙන් ඇරඹිය හැකිය / ස්වයං පාලනය / සියලුම ලාභ අයිතිකරු සතුවීම / ව්‍යාපාර තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා වීම / කැපවීම / කළමණාකරණ කටයුතු තනිවම තීරණය කිරීම / තම දක්ෂතා උපරිමව යෙදවීම (ල. 02)

(iv) (අ) ඉක්මනින් ගනුදෙනු ගිණුම්ගත කිරීමට හා අවශ්‍ය ගිණුම් වාර්තා ස්වයංක්‍රීයව පිළියෙල කර ගැනීමට හැකි වීම නිසා කාලය ඉතිරි වීම. / අවශ්‍ය ශ්‍රමය අවම වීම තුළින මුදල් ඉතිරි වීම / ස්වයංක්‍රීයව නිමවන ගිණුම් වාර්තාවල නිරවද්‍යතාව ඉහළ වීම / කාලීන දත්ත පහසුවෙන් ලබාගත හැකිවීම

(ආ) Acc pac / Quick book / MyOB / Sage (ල. 02)

05. (i) (අ) ව්‍යාපාරයක සිදුවන මුදලින් මැනිය හැකි ගනුදෙනු ගිණුම්පොත්වල සටහන් කර නිසි පරිදි වර්ග කර මූල්‍ය වාර්තා පිළියෙල කර අවශ්‍ය පාර්ශව වලට තොරතුරු ලබාදීමේ ක්‍රියාවලිය ගිණුම්කරණය වේ. (ල.01)

(ආ) ව්‍යාපාරයක් පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම ගිණුම්කරණයේ මූලික අරමුණ වේ. (ල.01)

(ii) (අ) කසුන් සංජීව රු. 500 000 ක් යොදවා ව්‍යාපාරයක් ආරම්භ කළේය.

(ආ) රු. 300 000 ක බැංකු ණයක් ගැනීම.

(ඉ) රු. 50 000 ක් වටිනා භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීම.

(ඊ) දුරකථන බිල රු. 5000 ක් ගෙවීම. (සිසුන් ලියා ඇති පිළිතුර සලකා බලා නිවැරදි නම් ලකුණු ලබාදෙන්න.) (ල.½x4=2)

(iii)

විකුණුම් ගිණුම

| | | |
|---|---|---|
| | 05/1 ණයගැති ගිණුම 50 000 | ½ |

ණයගැති ගිණුම (සුපුන්)

| | | |
|---|---|---|
| 05/1 විකුණුම් ගිණුම 50 000 | | ½ |

මුදල් ගිණුම

| | | |
|---|---|---|
| | 05/7 දුරකථන ගිණුම 5 000 | ½ |

දුරකථන ගිණුම

| | | |
|---|---|---|
| 05/7 මුදල් ගිණුම 5 000 | | ½ |

ගැණුම් ගිණුම

| | | |
|---|---|---|
| 05/10 ණයහිමි ගිණුම 25 000 | | ½ |

ණයහිමි ගිණුම (පියල්)

| | | |
|---|---|---|
| | 05/10 ගැණුම් ගිණුම 25 000 | ½ |

මුදල් ගිණුම

| | | |
|---|---|---|
| | 05/12 ගැනිලි ගිණුම 30 000 | ½ |

ගැනිලි ගිණුම

| | | |
|---|---|---|
| 05/12 මුදල් ගිණුම 3 000 | | ½ |

(එක් ආකෘතියක්වත් නිවැරදිව නැත්නම් ලකුණු ½ ක් කපන්න)

(iv) සිසුන් සපයා ඇති පිළිතුරට අදාළව නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ල.½ x 4 = 04)

06. (i) මූලික සටහන් පොතක කාර්යය / ලෙජර් ගිණුමක කාර්යය (ල.02)

(ii) මුදල් පොතේ වට්ටම් තීරුව සිහිවටන තීරුවකි / ගිණුම් කාලච්ඡේදය අවසානයේ වට්ටම් තීරුවල එකතුව ගෙන ලෙජරයේ දුන් වට්ටම් හා ලද වට්ටම් ගිණුම්වල සටහන් කරයි. (නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු ලබා දෙන්න.) (ල.01)

(iii) (අ) රු. 1500 (ල.01)

(ආ) රු. 1300 (ල.01)

(ඉ)

ගමන් වියදම්

| | |
|---|---|
| 10/31 සුළු මුදල් 420 | (1/2) |

තැපැල් ගාස්තු

| | |
|---|---|
| 10/31 සුළු මුදල් 210 (1/2) | |

ලිපි ද්‍රව්‍ය

| | |
|---|---|
| 10/31 සුළු මුදල් 350 | (1/2) |

නිමල්

| | |
|---|---|
| 10/31 සුළු මුදල් 400 (1/2) | |

(ල.04)

(iv)

බැංකු ගිණුම

| දිනය | විස්තරය | සු පි | වට්ටම් | වටිනාකම | දිනය | විස්තරය | සු පි | වට්ටම් | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10/02 | මුදල් | | (½) | 50 000 | 10/01 | ශේෂය ඉ/ගෙ | | | 25 000 | (½) |
| 10/05 | මුදල් (චෙක්) | | (½) | 5 000 | 10/04 | ණය හිමියෝ | | 500 | 4 500 | (½) |
| | | | | | 10/15 | ණයගැතියෝ | | | 5 000 | (½) |
| | | | | | 10/20 | විදුලි වියදම් | | | 1 500 | (½) |
| | | | | | 10/31 | ශේෂය ප/ගෙ | | | 19 000 | (1) |
| | | | | 55 000 | | | | 500 | 55 000 | |
| 11/01 | ශේෂය ඉ/ගෙ | | | 19 000 | | | | | | |

(නිවැරදි ලෙජර ගිණුම් ආකෘතිය නැත්නම් ලකුණු ½ ක් අඩුකරන්න.)

07. (i) ගිණුමේ පවතින ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කළ විට බැංකුව එම චෙක්පත්වලට ගෙවීම් කිරීම නිසා ගිණුම් හිමියා බැංකුවට ණයගැති වන අගයයි. (නිවැරදි ඕනෑම පැහැදිලි කිරීමට.) (ල.02)

(ii) නිවැරදි අයිතම 1 කට ලකුණු ½ බැගින් ලකුණු 02 යි.

(iii) (අ)

සංශෝධිත බැංකු ගිණුම

| | | | | |
|---|---|---|---|---|
| 10/31 ශේෂය ඉ/ගෙ | 16 000 | ස්ථාවර නියෝග | 5 000 | (½) |
| | | 10/31 ශේෂය ප/ගෙ | 11 000 | (½) |
| | 16 000 | | 16 000 | |

ජානකගේ ව්‍යාපාරයේ
2018 ඔක්තෝබර් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය

| | | | |
|---|---|---|---|
| සංශෝධිත බැංකු ශේෂය | | 11 000 | |
| <u>එකතු කළා :-</u> | | | |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් | 3 600 | 3 600 | (01) |
| | | 14 600 | |
| <u>අඩු කළා :-</u> | | | |
| තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් | 2 000 | (2 000) | (01) |
| බැංකු ප්‍රකාශයට අනුව ශේෂය | | 12 600 | (01) |

(මුළු ලකුණු 04)

(iv) (අ)

පොදු ජ'නලය

| | | | | |
|---|---|---|---|---|
| A. | ගැණුම් ගිණුම හර<br>ණය හිමියෝ<br>(සටහන් නොවූ ගැණුම් ඉන්වොයිසිය) | 4 500 | 4 500 | (½) |
| B. | වේතන ගිණුම හර<br>අවිනිශ්චිත ගිණුම<br>(ගෙවූ වේතන රු. 5400, 4500 ක් ලෙස සටහන් වීම නිවැරදි කිරීම) | 900 | 900 | (½) |
| C. | මෝටර් රථ අලුත්වැඩියා හර<br>අවිනිශ්චිත ගිණුම<br>(මුදල් පොතේ පමණක් සටහන් වීම නිවැරදි කිරීම) | 1 500 | 1 500 | (½) |
| D. | අවිනිශ්චිත ගිණුම හර<br>ලද පොලී ආදායම්<br>(මුදල් පොතේ පමණක් සටහන් වීම නිවැරදි කිරීම) | 800 | 800 | (½) |

(ආ)

අවිනිශ්චිත ගිණුම

| | | | | | |
|---|---|---|---|---|---|
| (½) | ශේෂ පිරික්සුමේ වෙනස | 1 600 | වේතන | 900 | (½) |
| (½) | ලද පොලී | 800 | මෝටර් රථ අලුත්වැඩියා | 1 500 | (½) |
| | | 2 400 | | 2 400 | |

(මුළු ලකුණු 04)